# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 17 දරන කම්කරුවන්ගේ විශේෂ දීමනා පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 ජූනි මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 60 යි

තැපැල් ගාස්තුව: ශත 15 යි

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 17 දරන කම්කරුවන්ගේ විශේෂ දීමනා පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 26 වන දින]

එල්.ඩී.—ඕ. 44/77.

**සේවායෝජකයන් විසින් ඇතැම් වර්ගවල කම්කරුවන්ට විශේෂ දීමනා ගෙවනු ලැබීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 17 දරන කම්කරුවන්ගේ විශේෂ දීමනා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1977 පෙබරවාරි මස දහ හත් වන දිනයෙහි සිට එය ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. *ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

**2.** (1) මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා විය යුතු ය. *නියම බලධරයා.*

(2) මේ පනතින් නියම බලධරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත ඒ බලධරයා විසින් පැවරිය හැකි ය.

## I වන කොටස

### පෞද්ගලික අංශයේ කම්කරුවන්ට ඇතැම් දීමනා ගෙවීම

**3.** (1) අදාළ දිනයේ සිට, යම් කර්මාන්තයක, මාසය සඳහා යම් පූර්ණ ඉපැයුම රුපියල් අට සියයක් නොඉක්මවන කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම මෙහි පහත දක්වා ඇති පදනම මත ගණන් බලනු ලැබූ දීමනාවක් එක් එක් මාසය වෙනුවෙන් ඒ කම්කරුවාට ගෙවිය යුතු ය :— *දීමනාව ගෙවීම.*

(අ) මාසික පදනමක් මත පාරිශ්‍රමිකය ගෙවනු ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, මාසය සඳහා එම කම්කරුවාට ගෙවිය යුතු වේතනයෙන් හෝ වැටුපෙන් සියයට විස්සකට නොඅඩු ප්‍රමාණයක් විය යුතු ය ;

(ආ) දෛනික වැටුප් ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, මාසය සඳහා එම කම්කරුවා වැඩ කර ඇති එක් එක් දිනය සඳහා ඔහුට ගෙවිය යුතු දෛනික වේතනයෙන් සියයට විස්සකට නොඅඩු ප්‍රමාණයක් විය යුතු ය ;

(ඇ) කෑලි ප්‍රමාණය අනුව සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, මාසය තුළ එවැනි කෑලි ප්‍රමාණය අනුව ඔහුට ගෙවිය යුතු වේතනයෙන් සියයට විස්සකට නොඅඩු මුදලක් විය යුතු ය :

එසේ වුව ද (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ ගෙවිය යුතු දීමනාව කිසිම අවස්ථාවක රුපියල් පනහක් නොඉක්මවිය යුතු ය.

ජ 33457—11,780 (78/04)

(2) මාසය සඳහා සම්පූර්ණ ඉපයුම රුපියල් අටසියයක් ඉක්මවන නමුත් රුපියල් අටසිය පනහකට අඩු කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, රුපියල් අටසිය පනහ හා එම කම්කරුවා විසින් ඒ මාසය සඳහා වැටුප හෝ වේතනය හෝ වශයෙන් ලබන මුදල හා අතර ඇති වෙනසට සමාන මුදලක් එක් එක් මාසය වෙනුවෙන් ඒ කම්කරුවාට දීමනාව ලෙස ගෙවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් යම් කම්කරුවකු වෙත—

(i) යම් සාමුහික ගිවිසුමක විධිවිධාන අනුව හෝ එය පදනම් කොට ගෙන නැතහොත් කාර්මික ආරාවුල් පනතේ 10 (2) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමයක් ප්‍රකාර අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයක් ; හෝ

(ii) කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය අනුව නිශ්චය කරනු ලබන ජීවන වියදම දීමනාවක්

ගෙවනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ පාරිතෝෂිකය හෝ දීමනාව වශයෙන් ඒ කම්කරුවාට ගෙවනු ලබන ප්‍රමාණයෙන්—

(අ) මාසය සඳහා එම කම්කරුවාගේ සම්පූර්ණ ඉපයුම රුපියල් හාරසියයක් නොඉක්මවන අවස්ථාවක, ඒ කම්කරුවාගේ වැටුපෙන් හෝ වේතනයෙන් සියයට දහයකට සමාන මුදලක් හෝ රුපියල් තිහක් යන දෙකින් අඩු මුදල ; සහ

(ආ) සම්පූර්ණ ඉපයුම රුපියල් හාරසියයකට වැඩිවන අවස්ථාවක රුපියල් පනහක මුදලක්

සේවායෝජකයා විසින් අඩු කර ගනු ලැබිය හැකි ය.

**අතිරේක දීමනාව ගෙවීම.**

4. (1) අදාළ දිනයේ සිට, යම් කර්මාන්තයක, මාසය සඳහා සම්පූර්ණ ඉපයුම රුපියල් අටසියයක් නොඉක්මවන යම් කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, 3 වන වගන්තියේ සඳහන් දීමනාවට අතිරේකව, එක් එක් මාසය සඳහා රුපියල් විසිපහකට නොඅඩු දීමනාවක් එම කම්කරුවාට ගෙවිය යුතු ය :

එසේ වුව ද—

(අ) ඒ සේවායෝජකයා 1971 සැප්තැම්බර් මස 10 වන දින අංක 14,975 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද යම් සාමුහික ගිවිසුමකින් හෝ ඒ සාමුහික ගිවිසුම සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 10 (2) වන වගන්තිය යටතේ වූ නියමයකින් හෝ බැඳී සිටින සේවායෝජකයකු වන අවස්ථාවක හෝ එවැනි යම් සාමුහික ගිවිසුමක් යටතේ ගෙවිය යුතු ප්‍රමාණවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් වේතන සහ අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයක් ස්වේච්ඡාවෙන් හෝ නොඑසේව ගෙවන සේවායෝජකයකු වන අවස්ථාවක, ගෙවිය යුතු දීමනාව, ඒ කම්කරුවා අයත් කම්කරු වර්ගයට හෝ පන්තියට 1975 ජනවාරි මාසය සඳහා ගෙවිය යුතු මාසික වේතනයෙන් සියයට දහයක් හෝ රුපියල් විසිපහක් යන දෙකින් අඩු ප්‍රමාණය විය යුතු ය ; තව ද

(ආ) ඒ සේවායෝජකයා තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයේ හෝ රබර් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයේ හෝ කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයේ හෝ පොල් වැවීමේ කර්මාන්තයේ හෝ කුරුඳු කර්මාන්තයේ හෝ දුම් කොළ කර්මාන්තයේ සේවායෝජකයකු වන අවස්ථාවක, ගෙවිය යුතු දීමනාව, ඒ කම්කරුවා අයත් කම්කරු වර්ගයට හෝ පන්තියට 1975 ජනවාරි මාසය සඳහා ගෙවිය යුතු දෛනික අවම වේතනය අනුව, මාසය තුළ ඔහු වැඩ කර ඇති දින ගණන සඳහා වේතන වශයෙන් ඒ කම්කරුවාට ගෙවිය යුතු ප්‍රමාණයෙන් සියයට දහයක් හෝ රුපියල් විසිපහක් යන දෙකින් අඩු ප්‍රමාණය විය යුතු ය .

(2) කම්කරුවකු කෑලි ප්‍රමාණය අනුව හෝ දින ප්‍රමාණය අනුව සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති අවස්ථාවක, ගෙවිය යුතු දීමනාව, ඒ කම්කරුවා අයත් කම්කරු වර්ගයට හෝ පන්තියට 1975 ජනවාරි මාසය සඳහා, අවස්ථාවෝචිත පරිදි, කෑලි ප්‍රමාණය හෝ දෛනික ප්‍රමාණය හෝ අනුව ගෙවිය යුතු වැටුපෙන් සියයට දහයකට නොඅඩු ප්‍රමාණයක් විය යුතු ය :

එසේ වුව ද මෙ උපවගන්තිය යටතේ ගෙවිය යුතු දීමනාව මසකට රුපියල් විසිපහක් නොඉක්මවිය යුතු ය.

(3) මාසික පදනමක් මත සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින කම්කරුවකු, ඔහුට සේවායෝජකයා විසින් වැඩ දීම නොකර හැරීම නොවන යම් හේතුවක් නිසා, යම් ලිඛිත නීතියකින් හෝ ගිවිසුමකින් නියමිත පරිදි වූ අවශ්‍ය දින ගණන වැඩ නොකරන අවස්ථාවක, ඒ කම්කරුවාට ගෙවිය යුතු දීමනාව මාසය සඳහා ඔහු වැඩ කර ඇති දින ගණනට ප්‍රමාණානුකූල විය යුතු ය.

(4) මාසය සඳහා සම්පූර්ණ ඉපයුම රුපියල් අටසියයක් ඉක්මවන නමුත් රුපියල් අටසිය හැත්තෑපහකට අඩු කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, රුපියල් අටසිය හැත්තෑපහ හා එම කම්කරුවා විසින් ඒ මාසය සඳහා වැටුප හෝ වේතනය හෝ වශයෙන් ලබන මුදල හා අතර ඇති වෙනසට සමාන මුදලක් එක් එක් මාසය වෙනුවෙන් ඒ කම්කරුවාට දීමනාව ලෙස ගෙවිය යුතු ය.

(5) මෙ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලබන දීමනාව—

(අ) 1967 අංක 5 දරන සාමූහික ගිවිසුම අදාළ වන කම්කරුවකුට ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් සාමූහික ගිවිසුම යටතේ ගෙවිය යුතු ප්‍රමාණයට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් වේතන සහ අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයක් සේවායෝජකයා විසින් ස්වෙච්ඡාවෙන් ම හෝ නොඑසේව ගෙවනු ලබන කම්කරුවකුට ;

(ඇ) කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය අනුව නිශ්චය කරන ලද ජීවන වියදම් දීමනාවක් සේවායෝජකයා විසින් ගෙවනු ලබන කම්කරුවකුට ;

(ආ) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වන වගන්තිය යටතේ අනුමත පුණ්‍යායතනයක් ලෙස ප්‍රකාශිත ආයතනයක සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින කම්කරුවකුට ; සහ

(ඉ) යම් කම්කරුවකුගේ සේවායෝජකයකු 1971 සැප්තැම්බර් මස 10 වන දින අංක 14,975 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද යම් සාමූහික ගිවිසුමක් සම්බන්ධයෙන්, කාර්මික ආරාවුල් පනතේ 10 (2) වන වගන්තිය යටතේ කරන ලද නියමයකින් බැඳී සිටී ද, ඒ ගිවිසුම අනුව වේතන සහ අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයක් ඔහු විසින් ගෙවනු ලැබේ ද ඒ සේවා යෝජකයා විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින කම්කරුවන්ගේ සම්පූර්ණ ගණන විසිපහකට අඩුවන අවස්ථාවක, ඒ කම්කරුවාට

නො ගෙවිය යුතු ය.

අර්ථ නිරූපණය.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතේ මේ කොටසෙහි—

"කර්මාන්තය" යන්නට සේවායෝජකයකු විසින් හෝ කම්කරුවකු විසින් හෝ පවත්වා ගෙන යනු ලබන, ඉටු කරනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, ව්‍යවසායයක්, ව්‍යාපෘතියක්, වෘත්තියක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මාන්තයක යම් අංශයක් හෝ එබන්දක යම් කටයුත්තක් හෝ යම් කාර්ය පද්ධතියක් ඇතුළත් වන නමුත්, සේවායෝජකයකුගේ තත්ත්වයෙන් ආණ්ඩුව විසින් මුළුමනින් ම ප්‍රාග්ධනය ප්‍රතිපාදනය කරනු ලබන, සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් විසින් හෝ, බාලාපරාධකරුවන්ට හෝ අනාථ දරුවන්ට හෝ අසරණ, ගොළු, බිහිරි හෝ අන්ධ තැනැත්තන්ට කාර්මික පුහුණුවක් දීමේ කාර්යය සඳහා ධූර්ත්‍ය වශයෙන් පවත්වාගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළෙඳ ව්‍යාපාරයක් හෝ ව්‍යවසායක් ඊට ඇතුළත් නොවේ ; තව ද

"කම්කරුවා" යන්නෙන් යම් කර්මාන්තයක, කාර්මික ව්‍යාපාරයක වෙළෙඳ ව්‍යාපාරයක, ව්‍යාපෘතියක හෝ ජීවනෝපායක යම් වැඩක් කිරීම පිණිස වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන ගිවිසුමක් යටතේ යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති තැනැත්තකු අදහස් වන අතර යම් ලිඛිත නියියක් මඟින් හෝ අන්‍යාකාරයකින් ස්වකීය වැටුප හෝ වේතනය විධිමත් කරනු ලැබ ඇති කම්කරුවකු සහ කෑලි ප්‍රමාණය අනුව සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති කම්කරුවකු ද ඊට ඇතුළත් වන නමුත් ගෘහ සේවකයකු හෝ සේවායෝජකයකුගේ පෞද්ගලික රියැදුරකු ඊට ඇතුළත් නොවේ.

## II වන කොටස

### පෞද්ගලික අංශයේ ඇතැම් වර්ගවල කම්කරුවන්ට ඇතැම් දීමනා ගෙවීම

වැවිලි කර්මාන්තයේ කම්කරුවන්ට අතිරේක විශේෂ දීමනාව ගෙවීම.

**6.** (1) (අ) තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයේ ; හෝ

(ආ) රබර් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයේ ; හෝ

(ඇ) පොල් වැවීමේ කර්මාන්තයේ

කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, අදාළ දිනයේ සිට, ඒ කම්කරුවාට, මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයන් අනුව (මෙහි මින් මතු ''අතිරේක විශේෂ දීමනාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) දීමනාවක් ගෙවිය යුතු ය.

(2) අතිරේක විශේෂ දීමනාව, පඩි පාලක සභා ආඥාපනතේ 20 (2) (අ) (ii) වන වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි, තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය හෝ රබර් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය හෝ පොල් වැවීමේ කර්මාන්තය සඳහා වූ පඩි පාලක සභාව විසින් කරන ලද යම් තීරණයක් යටතේ ගෙවිය යුතු යම් විශේෂ දීමනාවකට අතිරේක වශයෙන් ගෙවනු ලැබිය යුතු ය.

රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ අවම මාසික වේතන ප්‍රමාණය.

**7.** (1) කම්කරුවන් එක් සියයකට නොඅඩු සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරනු ලබන රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ සෑම සේවා යෝජකයකු විසින් ම, එක් එක් නුපුහුණු කම්කරුවකු මාසය තුළ යටත් පිරිසෙයින් දින විසිපහක් වත් වැඩකර තිබේ නම්, ඒ එක් එක් කම්කරුවාට අදාළ දිනයේ සිට, එක් එක් මාසය සම්බන්ධයෙන් රුපියල් එකසිය අසූවක් වන අවම මාසික වේතන ප්‍රමාණයක් ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් මාසික වේතන ප්‍රමාණයට, 1968 අංක 40 දරන සේවානියුක්තයන්ගේ මුදල් අවප්‍රමාණ කිරීමේ අතුරු දීමනා පනත යටතේ ගෙවිය යුතු මුදල් අවප්‍රමාණ කිරීමේ අතුරු දීමනාව ඇතුළත් වන ලෙස සැලකිය යුතු නමුත්, මේ පනතේ 3 වන සහ 4 වන වගන්තිවල සඳහන් දීමනා ඊට ඇතුළත් නොවිය යුතු ය.

වතු කම්කරුවන්ගේ සහතික අවම වේතනය.

**8.** (1) ප්‍රමාණයෙන් අක්කර එක් සියයකට නොඅඩු වූ ද, තේ, රබර්, පොල්, කොකෝවා, කරදමුංගු හෝ ගම්මිරිස් යන බෝග අතුරින් එකක් හෝ වැඩි ගණනක් වගා කර ඇත්තා වූ ද, වත්තක චෙක්රෝලෙහි නම සඳහන් වී ඇත්තා වූ කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, අදාළ දිනයෙන් පසු මාස හයක් වූ එක් එක් කාලපරිච්ඡේදය තුළ ඒ කම්කරුවා යටත් පිරිසෙයින් වැඩ කරන දින එකසිය අටක්වත් වැඩට පැමිණ පෙනී සිටියේ නම් සහ ඔහු එසේ වැඩට පැමිණ පෙනී සිටි විට, ඔහුට වැඩ දුන් දිනවල ඔහු වැඩ කළේ නම්, මාස හයක් වූ ඒ එක් එක් කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් සහතික අවම ප්‍රමාණයට නොඅඩු ප්‍රමාණයක් අදාළ දිනයේ සිට ඒ කම්කරුවාට වේතන වශයෙන් ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කම්කරුවකු එම උපවගන්තියේ සඳහන් යම් කාලපරිච්ඡේදයක් තුළ, ඒ කාලපරිච්ඡේදය ඇතුළත වැඩ කරන දින ගණන දින එකසිය අටකට අඩුවීමේ හේතුව නිසා ම යටත් පිරිසෙයින් වැඩ කරන දින එකසිය අටකටවත් වැඩට පැමිණ පෙනී සිටීමට අපොහොසත් වූ අවස්ථාවක, ඒ කම්කරුවා එසේ අපොහොසත් වූයේ වී නමුදු, සහතික අවම ප්‍රමාණය ගෙවනු ලැබීමට ඔහුට හිමිකම් ලැබිය යුතු ය.

(3) මේ වගන්තියෙහි—

"දෛනික අවම වේතනය" යන්නෙන්, එය කම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට—

(අ) කම්කරුවා අයත් වන්නේ යම් කර්මාන්තයකට ද ඒ කර්මාන්තයට අදාළ පඩි පාලක සභාව විසින් නියම කොට ඇති දෛනික වේතනයේ ;

(ආ) මේ පනත යටතේ එක් දිනයක් සඳහා කම්කරුවාට ගෙවිය යුතු යම් ප්‍රමාණයක ;

(ඇ) 1968 අංක 40 දරන සේවානියුක්තයන්ගේ මුදල් අව ප්‍රමාණ කිරීමේ අතුරු දීමනා පනත යටතේ එක් දිනයක් සඳහා කම්කරුවකුට ගෙවිය යුතු යම් ප්‍රමාණයක ; සහ

(ඈ) යම් සාමූහික ගිවිසුමක විධිවිධාන අනුව හෝ යම් සාමූහික ගිවිසුමක් පදනම් කොට ගෙන එක් දිනයක් සඳහා කම්කරුවාට ගෙවිය යුතු යම් ප්‍රමාණයක

මුළු එකතුව අදහස් වේ ; තව ද

"සහතික අවම ප්‍රමාණය" යන්නෙන්, මාස හයක් වූ එක් එක් කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් වූ විටක එකී එක් එක් කාල පරිච්ඡේදය තුළ කම්කරුවාට ලැබීමට හිමිකම ඇති දෛනික අවම වේතනයේ සාමාන්‍ය ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් එකසිය අටෙන් ගුණ කළ විට ලැබෙන ප්‍රමාණය අදහස් වේ.

සේවායෝජකයා විසින් නොබැඳි කොළැති චෙක් රෝලක් පවත්වා ගෙන යා යුතු බව.

**9.** (1) 8 වන වගන්තියේ සඳහන් කම්කරුවකුගේ සෑම සේවා යෝජකයකු විසින් ම නොබැඳි කොළැති චෙක්රෝලක් පවත්වා ගෙන යා යුතු අතර වැඩ කරන දිනයක වැඩට පැමිණ පෙනී සිටින කම්කරුවන් ගේ නම් එහි සටහන් කළ යුතු ය. ඒ චෙක්රෝල කම්කරුවන් වත්තේ වැඩට පැමිණ පෙනී සිටින ස්ථානයෙහි තැබිය යුතු අතර වත්තේ යම් කම්කරුවකු විසින් හෝ සේවායෝජකයා විසින් පිළිගෙන ඇති වෘත්තීය සමිතියේ වතු කමිටුවේ නියෝජිතයකු විසින් හෝ පරීක්ෂා කිරීම පිණිස එය විවෘතව තැබිය යුතු ය.

(2) සේවායෝජකයා විසින් පිළිගන්නා ලද වෘත්තීය සමිතියක වතු කමිටුවක නියෝජිතයකුට කම්කරුවන් වැඩට පැමිණ පෙනී සිටින වේලාවල දී සහ ස්ථානවල දී ද වැඩෙන් පසුව ද වත්තට පැමිණ සිටීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

වේතනය සහතික අවම වේතනයට අඩුවන අවස්ථා.

**10.** 8 වන වගන්තියේ සඳහන් යම් කාලපරිච්ඡේදයක් තුළ ඒ වගන්තියේ සඳහන් කම්කරුවකුට සේවායෝජකයකු විසින් වේතන වශයෙන් ගෙවනු ලබන ප්‍රමාණය සහතික අවම ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවක, සහතික අවම ප්‍රමාණය හා ඒ කාලපරිච්ඡේදය තුළ වේතන වශයෙන් ගෙවන ලද ප්‍රමාණය හා අතර වෙනස ඒ කාලපරිච්ඡේදය අවසානයේ දී දින තිහකට වඩා පසු නොවී එම සේවායෝජකයා විසින් එම කම්කරුවාට ගෙවිය යුතු ය.

තේ වතු කම්කරුවන්ට පරිපූරක වේතනයක් ගෙවීම.

**11.** ප්‍රමාණයෙන් අක්කර එක් සියයකට අඩු නොවූ යම් තේ වත්තක තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයේ යම් කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, ඒ කම්කරුවා වැඩ කරන එක් එක් දිනය වෙනුවෙන්, මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රමාණ අනුව ගණන් බලනු ලැබූ පරිපූරක වේතනයක් අදාළ දිනයේ සිට එම කම්කරුවාට ගෙවිය යුතු ය.

**12.** පඩි පාලක සභා ආඥපනතේ විධිවිධාන, 6 වන වගන්තියේ සඳහන් අතිරේක විශේෂ දීමනාව ගෙවීමට සහ ඒ ගෙවීම සම්බන්ධයෙන් සහ 7 වන වගන්තියේ සඳහන් රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ කම්කරුවන් සඳහා අවම මාසික වේතන ප්‍රමාණ ගෙවීමට සහ ඒ ගෙවීම සම්බන්ධයෙන්, ඒ ගෙවීම උචිත පඩි පාලක සභාව විසින් කරන ලද තීරණයකින් නියම කරනු ලැබ ඇති විටක මෙන්, අදාළ විය යුතු ය.

පඩි පාලක සභා ආඥපනතේ විධිවිධාන ඇතැම් දීමනා සම්බන්ධයෙන් අදාළ වන බව.

## III වන කොටස

### සාමාන්‍ය කරුණු

**13.** වෙනත් යම් ලිඛිත නීතියක හෝ වාචික වූ හෝ, ලිඛිත වූ හෝ, ප්‍රකාශිත වූ හෝ, ගම්‍යමාන වූ හෝ යම් සේවානියුක්ති ගිවිසුමක හෝ කුමක් සඳහන් වුව ද මේ පනතේ විධිවිධාන වලංගු හා බලසහිත විය යුතු ය ; තව ද ඒ අනුව, ඒ විධිවිධාන හා ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති අවස්ථාවක, ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම අභිභවා, එම නොගැලපීමේ ප්‍රමාණයට, එම විධිවිධාන බල පැවැත්විය යුතු ය.

වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද මේ පනත වලංගු හා බලසහිත විය යුතු බව.

**14.** අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි, යම් සේවායෝජකයකු විසින් මේ පනතේ සඳහන් කර්මාන්ත අතුරින් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති නුපුහුණු කම්කරුවකු ද ඇතුළුව සෑම කම්කරුවකු ම, ඒ සේවායෝජකයාගේ කම්කරුවකු වශයෙන් ඔහු සේවය කරන තාක් කල්, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඒ කම්කරුවා භුක්ති විඳිමින් සිටි, නමුත් මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ සාදන ලද හදිසි අවස්ථා නියෝග යටතේ ඔහුට ගෙවනු ලැබූ යම් දීමනා නොවන වැටුප්වලට, දීමනාවලට හෝ කවර නාමයකින් හෝ අභිධානයකින් හෝ හඳුන්වනු ලබන මුදලින් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියමවලට හා කොන්දේසිවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි මත, ඒ සේවායෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු අතර මේ පනතේ ඉහතින් වූ විධිවිධාන යටතේ ගෙවිය යුතු දීමනා, එම වැටුප් වලට, දීමනාවලට හෝ වෙනත් ගෙවීම්වලට අතිරේකව විය යුතු ය.

සේවා නියුක්තිය නොකඩවා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

**15.** (1) යම් කර්මාන්තයක කම්කරුවකුගේ සේවායෝජකයකු විසින්, ඒ කර්මාන්තයේ සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවන් සම්බන්ධයෙන්—

(අ) සේවයෙහි නියුක්ත කර ඇති එක් එක් කම්කරුවාගේ නම ;

(ආ) ඒ එක් එක් කම්කරුවා විසින් ඉටු කරනු ලබන වැඩයේ වර්ගය ; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන අනුව ඒ එක් එක් කම්කරුවාට ගෙවනු ලබන මුදල

දක්වෙන ලේඛනයක්, ඒ කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන්නේ යම් ස්ථානයක ද, ඒ ස්ථානයෙහි තබා ගෙන පවත්වා ගෙන යා යුතු ය.

සේවායෝජකයන් විසින් වාර්තා තබා ගැනීම.

(2) සේවායෝජකයකු වශයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් වාර්තාවක් පවත්වා ගෙන යන්නා වූ හෝ, පවත්වා ගෙන ගිය හෝ සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ එම වාර්තාව පවත්වා ගෙන යාමට නියම වූයේ යම් දිනයක සිට ද ඒ දිනයෙහි සිට අවුරුදු හතරක කාලයක් එම වාර්තාව සුරක්ෂිතව තබා ගත යුතු අතර, පරීක්ෂා කිරීම සඳහා එම වාර්තාව ඉදිරිපත් කරන ලෙස සහ එම වාර්තාවේ සත්‍ය පිටපතක් සපයන ලෙස හෝ එවැනි පිටපතක් සාදා ගැනීමට ඉඩ සලසන ලෙස හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබූ විට, එසේ කළ යුතු ය.

නියම කළ බලධරයාගේ බලතල.

**16.** නියම බලධරයාට—

(අ) යම් ලේඛනයක් හෝ වෙනත් පිළිබඳ වාර්තාවක් පරීක්ෂා කිරීමේ හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ දැයි නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා හෝ මේ පනතේ සඳහන් කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින යම් ස්ථානය කට දිවා හෝ රාත්‍රී කාලයේ සියලු යුක්තිසහගත වේලාවන් හි දී ඇතුළු වී ඒ ස්ථානය පරීක්ෂා කිරීමට ; හෝ

(ආ) තමා එම ස්ථානය පරීක්ෂා කරන විට, පරීක්ෂා කිරීම සඳහා එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, ඒ ලේඛනය හෝ වාර්තාව නියමිත පසු දිනයක දී පරීක්ෂා කිරීම සඳහා ඒ ස්ථානයේ දී හෝ තම කාර්යාලයේ දී ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ; හෝ

(ඇ) එවැනි යම් සම්පූර්ණ ලේඛනයක හෝ වාර්තාවක හෝ එහි යම් කොටසක පිටපත් ගැනීමට ; හෝ

(ඈ) එම ස්ථානයේ සිට තමන්ට දක්නට ලැබෙන්නා වූ ද ඒ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්තයක යෙදී සිටින හෝ සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති සේවායෝජකයකු හෝ කම්කරුවකු යයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇත්තා වූ ද යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට ; හෝ

(ඉ) මේ පනත අදාළ වන යම් සේවායෝජකයකුට—

(i) එවැනි යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින සියලුම කම්කරුවන්ට හෝ ඒ කම් කරුවන්ගෙන් සමන්විත යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අදාළ වන්නා වූ ද මේ පනතේ කාර්ය සඳහා තමා විසින් නියම කරනු ලබන විස්තර ඇතුළත් වන්නා වූ ද වාර වාර්තාවක් ;

(ii) එවැනි යම් සේවායෝජකයකු විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක සඳහන් යම් විස්තර සම්බන්ධයෙන් තමා නියම කරන තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් ; හෝ

(iii) එවැනි යම් සේවායෝජකයකු විසින් පවත්වා ගෙන යනු ලබන යම් සම්පූර්ණ ලේඛනයක හෝ වාර්තාවක හෝ එහි යම් කොටසක සත්‍ය පිටපතක්

නිශ්චිත දිනයක දී හෝ ඉන් පෙර තමා වෙත සපයන ලෙස ලියවිල්ලකින් විධාන කිරීමට

බලය ඇත්තේ ය.

**17.** අදාළ දිනයෙහි හෝ ඉන් පසුව— වැරදි හා දණ්ඩන.

(අ) 15 වන වගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

(ආ) 16 වන වගන්තිය යටතේ යම් ඇතුළුවීමක් හෝ පරීක්ෂා කිරීමක් සඳහා හෝ නියම බලධරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ අවශ්‍ය ලෙස ඔහුට වුවමනා වන්නා වූ විධි සැලසීම පැහැර හරින ; හෝ

(ඇ) 16 වන වගන්තියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ බලධරයාට බාධා කරන හෝ හිරිහැර කරන ; හෝ

(ඈ) 16 වන වගන්තියෙන් පවරා ඇති බලතල යටතේ ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස ඒ බලධරයා තමාට නියම කරන යම් ලේඛනයක් හෝ වේතන පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම හෝ ප්‍රතික්ෂේප කරන ; හෝ

(ඉ) යම් වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් සාවද්‍ය වන්නා වූ යම් ලේඛනයක් හෝ වේතන පිළිබඳ වාර්තාවක් පිළියෙළ කරන හෝ පිළියෙළ කරනු ලැබීමට සලස්වන නැතහොත් 16 වන වගන්තියෙන් පවරා ඇති බලතල යටතේ ක්‍රියා කරන එම බලධරයා වෙත යම් ලේඛනයක් හෝ වාර්තාවක් එය සාවද්‍ය බව දැන දැන ම ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබීමට සලස්වන හෝ දැන දැන ම ඉදිරිපත් කරනු ලැබීමට ඉඩ හරින ; හෝ

(ඊ) 16 වන වගන්තියෙන් පවරන ලද බලතල යටතේ ක්‍රියා කරන එම බලධරයාට යම් තොරතුරක්, එය සාවද්‍ය බව දැන දැන ම සපයන ; හෝ

(උ) 16 වන වගන්තිය යටතේ එම බලධරයා විසින් දෙන ලද යම් විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ එකී 16 වන වගන්තිය යටතේ වාර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට සාවද්‍ය වාර වාර්තාවක් හෝ යම් සාවද්‍ය ප්‍රකාශයක් ඇතුළත් වාර වාර්තාවක් හෝ දැන දැන ම ඉදිරිපත් කරන හෝ සපයන හෝ ඉදිරිපත් කරනු ලැබීමට හෝ සපයනු ලැබීමට සලස්වන

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

**18.** 3 වන වගන්තිය හෝ 4 වන වගන්තිය හෝ 6 වන වගන්තිය හෝ 7 වන වගන්තිය හෝ 8 වන වගන්තිය හෝ 11 වන වගන්තිය යටතේ කම්කරුවකුට ලැබිය යුතු යම් මුදලක් ඔහුගේ වේතනවල කොටසක් වන බව යම් ලිඛිත නීතියක සියලු කාර්ය සඳහා හෝ නො එසේ වූ, සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, එවැනි කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම එම කම්කරුවාගේ වේතන ගෙවීමට තමා යටත් වන කාල පරිච්ඡේදය ඇතුළත එම මුදල ගෙවිය යුතු ය. මේ පනත යටතේ ලැබිය යුතු ගෙවීම් ; කම්කරුවකුගේ වේතනවල කොටසක් විය යුතු බව.

කම්කරුවන්ට ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීම.

**19.** (1) මේ පනත යටතේ තමාගේ කම්කරුවකුට ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබ ඇති මුදලක් ගෙවීම පැහැර හරින යම් සේවා යෝජකයකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් සේවායෝජකයකුගේ කම්කරුවකුට ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබ ඇති යම් මුදලක් ගෙවීමට ඒ සේවා යෝජකයා පැහැර හැරීමේ හේතුවෙන් වූ වරදක් සම්බන්ධයෙන්, ඒ සේවායෝජකයා මහෙස්ත්‍රාත් අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අධිකරණය විසින්, එම වරද සඳහා ඒ අධිකරණය විසින් නියම කළ හැකිව තිබූ වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, ආඥාවේ සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල ඒ කම්කරුවාට ගෙවන ලෙස එම සේවා යෝජකයාට ආඥා කරනු ලැබිය හැකිය. තව ද ඒ මුදල එසේ නොගෙවනු ලැබුවහොත් අධිකරණයේ ආඥාවක් මත එම මුදල ලබාගෙන එම කම්කරුවාට ගෙවනු ලැබිය හැකි ය.

නියෝග.

**20.** (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන ලද දිනයේ දී හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**21.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

''ළමා කම්කරුවා'' යන්නෙන් වයස අවුරුදු දහසයට අඩු පිරිමි කම්කරුවෙක් හෝ වයස අවුරුදු පහළොවට අඩු කම්කරු ස්ත්‍රියක් හෝ අදහස් වේ ;

''පොල් වැවීමේ කර්මාන්තය'' යන්නෙහි, එම කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, 1949 මාර්තු මස 30 වන දින අංක 9,961 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

''සාමූහික ගිවිසුම'' යන්නෙහි කාර්මික ආරාවුල් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය :

"කොමසාරිස්වරයා" යන්නෙන් තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ කම්කරු නිලධරයකු වශයෙන් හෝ තත් කාලයේ ධුර දරන යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ ;

"ඉපයුම" යන්නෙහි, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"සේවායෝජකයා" යන්නෙන් යම් කර්මාන්තයක, තමා වෙනුවෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් යම් කම්කරුවකු සේව යෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා හෝ අදහස් වන අතර යම් කර්මාන්තයක වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කම්කරුවකු සේව යෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ ;

"රබර් වැවීමේ හා නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය" යන්නෙහි, එම කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, 1949 ඔක්තෝබර් මස 22 වන දින අංක 10,035 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයෙන් ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය" යන්නෙහි, එම කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය" යන්නෙහි, එම කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 1967 අගෝස්තු මස 25 වන දින අංක 14,763 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ, 1973 මාර්තු මස 30 වන දින අංක 53 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියමයෙන් සංශෝධිත නියම යෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"කර්මාන්තය" යන්නෙහි, II වන හා III වන කොටස්වල දී, පඩි පාලක සභා ආඥාපනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"නුපුහුණු කම්කරුවා" යන්නෙහි, රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය සඳහා පඩි පාලක සභාව විසින් කරනු ලැබ, 1971 අප්‍රේල් මස 29 වන දින අංක 14,955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද තීරණයෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"වේතන" යන්නෙහි, පඩි පාලක සභා ආඥාපනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

" කම්කරුවා " යන්නෙහි, II වන හා III වන කොටස්වල දී, පඩි පාලක සභා ආඥාපනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ; තව ද

" වැඩ කරන දින " යන්නෙන්, එය වත්තක් සම්බන්ධයෙන් යෙදෙන විට, වත්තේ වැඩ කරනු ලබන දින අදහස් වේ.

(6 වන වගන්තිය.)

## පළමුවන උපලේඛනය

මෙහි පහත I වන තීරයෙහි සඳහන් කම්කරුවකුට 6 වන වගන්තිය යටතේ ගෙවිය යුතු අතිරේක විශේෂ දීමනාව, මෙහි පහත II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වා ඇති ප්‍රමාණය අනුව විය යුතු ය :—

| I වන තීරය<br>කම්කරුවාගේ පන්තිය | II වන තීරය<br>සාමාන්‍ය වැඩ කරන දිනයක් සඳහා අතිරේක විශේෂ දීමනාව |
|---|---|
| වයස අවුරුදු 16ට වැඩි පිරිමි කම්කරුවකුට ... | ශත 18යි |
| වයස අවුරුදු 15ට වැඩි කම්කරු ස්ත්‍රියකට ... | ශත 12යි |
| ළමා කම්කරුවකුට ... ... | ශත 12යි |

(11 වන වගන්තිය.)

## දෙවන උපලේඛනය

| I වන තීරය<br>පසුගිය මාසය සඳහා කොළඹ තේ වෙන්දේසියේ දී සියලු මැද රට තේ සඳහා මාසික සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිල | II වන තීරය<br>එක් කම්කරුවකුට එක් දිනයකට ගෙවිය යුතු පරිපූරක වේතනය |
|---|---|
| (අ) රු. 2.50කට නොඅඩු නමුත් රු. 2.74කට නොවැඩි අවස්ථාවක ... | ශත 10කි |
| (ආ) රු. 2.75කට නොඅඩු නමුත් රු. 2.99කට නොවැඩි අවස්ථාවක ... | ශත 20කි |
| (ඇ) රු. 3.00කට නොඅඩු අවස්ථාවක ... | ශත 30කි |